# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,193 - 2020 සැප්තැම්බර් මස 11 වැනි සිකුරාදා - 2020.09.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 592 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 593 |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - (i) වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 සැප්තැම්බර් මස 04 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 සැප්තැම්බර් මස 04 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 සැප්තැම්බර් මස 04 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iv) විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත 2020 අගෝස්තු මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(v) මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත 2020 සැප්තැම්බර් මස 04 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 ඔක්තෝබර් මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 සැප්තැම්බර් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


මෙම *ගැසට් පත්‍රය www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසි විකිණීමයි

ගම්පහ දිසා අධිකරණයේ දී ය

*නඩු අංක* : 169/MB
*ස්වභාවය* : උකස්
*කාර්යය පටිපාටි* : සාමාන්‍ය
*වටිනාකම* : රු. මිලියන 18 යි
*ගම්පහ දිසා අධිකරණයේ*
*ඇස්කීසි අංක* : 88/19

කොළඹ 10, ටී.බී.ජයා මාවතේ, අංක 479 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය සහ දෙල්ගොඩ නව නුවර පාරේ අංක 351F දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.

.....................*පැමිණිලිකරු.*

*එදිරිව*

වැලිවේරිය, නව නුවර පාරේ, අංක 301/4 දරන ස්ථානයේ ෂයින් සෙලියුලර්ස් සෙන්ටර් යන නාමය විලාශය හා ව්‍යාපාර නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන මාළුගේ සජීව රොෂාන් ඩයස්

.........................*විත්තිකරු.*

ඉහත අංක සඳහන් නඩුවෙන් මා හට නිකුත් කරන ලද අධිකාරි පත්‍රයට අනුව පැමිණිලිකාර බැංකුව විත්තිකරු වන ෂයින් සෙලියුලර්ස් සෙන්ටර් යන නමින් ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යන මාළුගේ සජීව රොෂාන් ඩයස් විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු බවට ඒක පාක්ෂික තීන්දු ප්‍රකාශයෙන් නියම කර ඇති රු. 1,397,770/12 ක මුදල 2012 ජුලි 01 වන දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් ඒ සඳහා වර්ෂයකට 18.5% බැගින් පොළියද සමග ගෙවන මෙන් ද, රු. 146,325/54 ක මුදල 2012 ජුලි 01 දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් 23.5% බැගින් පොළියද සමග ගෙවන මෙන් ද, රු.156,639/02 ක මුදල 2012 ජුලි 01 දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් 23.5% බැගින් පොළියද සමග ගෙවීම පැහැර හැර ඇති හෙයින් පහත උප ලේඛනයේ විස්තර වන දේපළ වර්ෂ 2020 ඔක්තෝබර් මස 09 වැනි දින පෙ.ව 11.00 ට විත්තිකරුගේ දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී වෙන්දේසියෙහි දී ඉහලම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් මුළු ගැනුම් මිලෙන් සියයට විසි පහක් [25%] මුදලක් ද, පිස්කල් ගාස්තු රජයට අය විය යුතු ගාස්තු තක්සේරු ගාස්තු වෙන්දේසි ගාස්තු *ගැසට් පත්‍රයේ* සහ පුවත් පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් එවලේම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාර ගනු නොලැබේ. ගැනුම් මිලෙන් සියයට හැත්තෑ පහක [75%] ඉතිරි මුදල දින 30ක් ඇතුළත ගම්පහ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කල යුතුය.

### දේපළ පිහිටි ස්ථානයට ප්‍රවේශ වන මාර්ගය

දෙල්ගොඩ මාර්ගයේ සිට නැදුම්ගමුව පාරේ මීටර් 300ක් පමණ ඉදිරියට ගොස් වමට ඇති බොරළු පාරේ මීටර් 250ක් පමණ ඉදිරියට ගොස් දකුණට ඇති අඩි 12ක් පමණ පහළ පාරේ මීටර් 30ක් පමණ ඉදිරියට ගිය විට පාර අවසානයේ වම්පස මෙම දේපළ පිහිටා ඇත.

### ඉහත කී පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, මැද පත්තුවේ, නැදුන්ගමුවෙහි පිහිටි ''මිල්ලගහවත්ත'' *හෙවත්* ''ගලවත්ත'' නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන කොටසට බලයලත් මිනින්දෝරු එල්.ජේ. ලියනගේ විසින් මැන සාදන ලද අංක 6951B 1999/08/09 දිනැති පිඹුර ප්‍රකාර මායිම් උතුරු නැගෙනහිර :- දෙවටෙන් ද, දකුණු නැගෙනහිරට :- ලොට් 2 සහ ලොට් 6 න් ද ( අඩි 12 ක් පළල පාර ) න් ද, දකුණු බස්නාහිරට :- ලොට් 6 ද (අඩි 12 ක් පළල පාර) සහ ලොට් 7 න් ද, උතුරු බස්නාහිරට :- එච්.එම්. ෆොන්සේකාගේ ඉඩමෙන් මායිම් වූ රූඩ් 1 ක් (අ. 0 රූ. 1 පර්. 0) ක් විශාල ඉඩම, ගොඩනැගිලි, ගහකොළ සහ සියලු දේත් සමග වේ. මෙම ඉඩම ගම්පහ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 571/258 යටතේ ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ගම්පහ.

වර්ෂ 2020 ක් වූ අගෝස්තු මස 24 වැනි දින දී ය.

09-289

# නොතාරිස් ලැයිස්තුව

## දැන්වීමයි

### 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

කුරුණෑගල මහාධිකරණ කලාපය තුල සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ ජයමාන්න මොහොට්ටි තෙන්නකෝන් මුදියන්සේලාගේ පුෂ්පලතා උමයංගනී තෙන්නකෝන් මහත්මියගේ 2020.01.01 වැනි දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම ගරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2020 ජූලි මස 26 වැනි දින,
කොළඹ.

09-346

---

## දැන්වීමයි

### 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

මහනුවර මහාධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ වලිමුනි ආරච්චිගේ විමලරත්න මහතාගේ 2020.03.01 වැනි දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම ගරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2020 ජූලි මස 08 වැනි දින,
කොළඹ.

09-347

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.